ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගමේ (''සමාගම'') 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරු වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අඛණ්ඩ පැවැත්මට අදාළ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාව

2013 මූල්‍ය වර්ෂයේ සිට විදුලිය බෙදාහැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ ප්‍රධාන ව්‍යාපාරික කටයුතු සමාගම විසින් නතර කළ බව විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් 2.1 සටහන වෙත අවධානය යොමු කරවීමට කැමැත්තෙමිඑහි දක්වා ඇති පරිදි ., සමාගම 2024 දෙසැම්බර් 31 වන විට රු .18,982,129 ක සමුච්චිත අලාභයක්)2023 – රු .20,498,361) ලබා ඇති අතර එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු.1,516,232 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.) 2023 – රු .2,014,248 ක බදු වලට පෙර අලාභය(. 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ වාසිදායක ශුද්ධ වත්කම් ප්‍රමාණය රු.6,018,871)2023 - රු .4,502,639) ක් වූ අතර එය ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකට වඩා අඩුවෙන් පැවැතුණි. ඒ අනුව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වැනි වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පරිදි තදබල ප්‍රාග්ධන පාඩුවක් පෙන්නුම් කරන අතර, සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් අත්හිටුවීමත් සමඟ සමාගමට අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පෙන්නුම් කර තිබුණුකෙසේ වෙතත් ., එම සටහනෙහි හෙළිදරව් කර ඇති පරිදි, සමාගමට එහි මව් සමාගම වන ලංකා විදුලි පුද්ගලික සමාගම වෙතින් අඛණ්ඩව මූල්‍ය පහසුකම් ලැබීම මත සමාගමට අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකියාව ලැබී තිබුණි.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.5 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 09 වන ඡේදයට අනුව, තොග, පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගයෙන් වඩා අඩු වටිනාකමට අගය කල යුතු වුවත්, සමාගම සතු අමුද්‍රව්‍ය සහ නිමි තොග වල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ සැලකීමකින් තොරව පිළිවෙලින් රු.4,827,898 සහ රු.6,729,463 ක් ලෙස, පිරිවැය මත තොග අගය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ අමුද්‍රව්‍ය සහ නිමි තොග සඳහා භෞතික තොග සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.	විගණකගේ නිරීක්ෂණය සමග එකග වේ. 2025 මැයි 9 වන දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව, ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම සතු වත්කම් සහ තොග අයිතම සත්‍යාපනය කිරීමට සහ වාර්තා කිරීමට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල කමිටුවක් පත් කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 අනුකූලව තොග පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු වටිනාකමට අගය කල යුතු අතර, තොග වල නිරවද්‍යතාවය සහ අනුකූලතාවය සහතික කිරීම සඳහා කාලීනව භෞතික තොග සත්‍යාපන කටයුතු සිදු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් ලංකා විදුලි පුද්ගලික සමාගමෙහි හා ඇන්ටි ලොකෝ මීටරින් සමාගමේ ගබඩාවලට මාරු කර තිබුණ ද, රු.5,159,044 වූ උක්ත වත්කම්වල පිරිවැය සහ සමුච්චිත ක්ෂය අගය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	විගණකගේ නිරීක්ෂණය සමග එකග වේ. අපහරණය කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ අදාළ සියලුම රෙගුලාසිවලට අනුකූලව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව, මූල්‍ය ප්‍රකාශන හි ඇතුළත් දේපල, පිරියත හා උපකරණ, නිවැරදිව ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා, එවා බැහැර කරන ලද අවස්ථාවේදීම, පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කල යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයයේ දී ලැබිය යුතු මුදල් ලෙස හඳුනා ගත යුතු රු.106,134 වූ රඳවා ගැනීමේ බදු, මූල්‍ය පිරිවැයක් ලෙස වැරදි ලෙස වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශණ වල දක්වා තිබුණි. මේ හේතුවෙන්, 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය පිරිවැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබූ අතර වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවෙන් දක්වා තිබුණි. එම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.	එය ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කරනවා වෙනුවට වියදමක් ලෙස වැරදි ලෙස සටහන් කර ඇත. මෙම වැරදි වර්ගීකරණය නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනීමට කටයුතු කරනු ඇත.	මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා නිසි සමාලෝචන ක්‍රියාවලියක් තිබිය යුතු අතර ලැබිය යුතු රඳවා ගැනීමේ බද්ද නිවැරදි ගිණුමට ඇතුලත් කල යුතුය.

1.6.3 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගම විසින් 2013 මූල්‍ය වර්ෂයේ සිට, සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යය වූ විදුලිය බෙදාහැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ කාර්යය නතර කර තිබුණි. සමාගම 2023 දෙසැම්බර් 31 වන විට රු. 20,498,361 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණු ද, සමාලොචිත වර්ෂය සඳහා රු .1,516,232 ක බදු වලට පෙර ලාභයක් වාර්තා කර තිබීම හේතුවෙන්, 2024 දෙසැම්බර් 31 වන විට සමුච්චිත අලාභය රු.18,982,129 ක් දක්වා අඩු වී තිබුණි. එසේම, 2023 වර්ෂයේ ශුද්ධ වත්කම් ප්‍රමාණය වූ රු.4,502,639 හා සසඳා බැලීමේදී 2024 දෙසැම්බර් 31 දිනට සමාගමේ වාසිදායක ශුද්ධ වත්කම් ප්‍රමාණය රු . 6,018,871 ක් වූ අතර එය ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකට වඩා අඩුවෙන් පැවැතුණි. ඒ අනුව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වැනි වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පරිදි තදබල ප්‍රාග්ධන පාඩුවක් පෙන්නුම් කල අතර, එ අනුව සමාගමේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාකාරකම් අත්හිටුවා ඇති පසුබිමක සමාගම අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් ඇති වී තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කර ඇත. මෙම අපගමනය සඳහා ස්ථිර විසඳුමක් ලෙස සහ 2025 මැයි 9 වන දින සම්මත කරන ලද යෝජනාවට අනුව, සමාගම වසා දැමීමට කටයුතු කරමින් පවතින අතර ක්‍රමානුකූල සහ අනුකූල විසුරුවා හැරීමක් සිදු කිරීම සඳහා අවශ්‍ය පියවර කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබේ.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ මූල්‍ය තත්ත්වය ඇගයීමට ලක් කළ යුතු අතර සමාගම් පනතේ 220 වගන්තිය යටතේ ප්‍රතිව්‍යුහගත කිරීම හෝ වසා දැමීම වැනි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. ප්‍රාග්ධන ඌනතාවය සපුරාලීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීමට අවශ්‍ය අවස්ථාවලදී වෘත්තීය උපදෙස් ලබා ගත යුතුය.

1.7 ලැබිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රකාශන වල දැක්වුනු රු9,454,718 ක් වූ දිගු කාලයක් තිස්සේ හිඟහිටි වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ ශේෂයෙන්, රු.7,412,245 ක් (ආසන්න වශයෙන් 78%) බාහිර (වෙනත්) පාර්ශවයන්ගෙන් නියෝජනය වී තිබුණි. කෙසේ වෙතත්, මෙම ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා සමාගම විසින් නිසිලෙස ණයගැති නාම ලේඛනයක්, වයස් විශ්ලේෂණයක්, ආධාරක ලියකියවිලි සහ මූලාශ්‍ර සාක්ෂි පවත්වා ගෙන ගොස් නොතිබුණි. ඒ අනුව ලැබිය යුතු මුදල්වලින් සැලකිය යුතු කොටසක් සඳහා නිවැරදි වාර්තා සහ ආධාරක ලේඛන පවත්වා ගැනීමට අපොහොසත් වීම තුලින් සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වල මට්ටමන පවත්නා බව පිළිබිඹු විය.	විගණකගේ නිරීක්ෂණය සමග එකග වන අතර සමාගමේ වසා දැමීමේ ක්‍රියාවලිය අතරතුර ණයගැතියන් වර්ග කිරීමට සහ හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ.	ලැබිය යුතු සියලුම හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2007 අංක 07 දරණ සමාගම් පනතේ 220 වගන්තිය	මෙම වගන්තියට අනුව, සමාගමක ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට 50% ට වඩා අඩු වූ විට, සමාගමේ පනතේ අවශ්‍යතා සපුරාලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අති විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතුය. කෙසේ වෙතත්, සමාගමේ ශුද්ධ වත්කම් නියමිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවති අතර, එවැනි රැස්වීමක් පවත්වා නොතිබුණි. තවද, සමාගම 2013 දී සිය ප්‍රධාන ව්‍යාපාරික මෙහෙයුම් කටයුතුද, 2023 දී ප්‍රධාන නොවන මෙහෙයුම් කටයුතුද නතර කර වර්ෂයක් ගත වී ඇතත් සමාගම අවසන් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කර ඇත. මෙම අපගමනය සඳහා ස්ථිර විසඳුමක් ලෙස, සහ 2025 මැයි 9 වන දින සම්මත කරන ලද යෝජනාවට අනුව, සමාගම දැනටමත් අවසන් කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතින අතර අනුකූල සහ ක්‍රමානුකූල විසුරුවා හැරීමක් සිදු කිරීම සඳහා අවශ්‍ය පියවර කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබේ.	සමාගම් පනත යටතේ අවශ්‍ය පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වහාම අති විශේෂ මහ සභා රැස්වීමක් කැඳවා, සමාගමේ මූල්‍ය තත්ත්වය තක්සේරු කර, ප්‍රාග්ධන ප්‍රතිව්‍යුහගත කිරීම හෝ අවසන් කිරීම වැනි සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 1.5 ක ලාභයක් වූ අතර එයට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රුපියල් මිලියන 2 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 3.5 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලොචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් නොමැති තත්ත්වයත් තුල, පෙර වර්ෂයේ පැවති දළ අලාභය ඉවත් ඉවත්වීම මෙම වර්ධනයට ප්‍රධානම හේතුව ලෙස දැක්විය හැකිය.

2.2 අනුපාත විශ්ලේෂණය

(අ) සමාගමේ ජංගම වත්කම් අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 1.2 සිට 1.3 දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) මෙහෙයුම් ක්‍රියාකාරකම් නොමැති වීම මත පෙර වර්ෂයේ දළ පාඩුව ඉවත් වීම හේතුවෙන් ස්කන්ධ මත ප්‍රතිලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට (44.7) සිට සියයට 25.2 දක්වා වැඩි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගමේ එක් ප්‍රධාන ව්‍යාපාරයක් වූ විදුලි කණු නිෂ්පාදනය වූ අතර, නිෂ්පාදිත විදුලි කණු වල තත්ව පරීක්ෂණය අසමත් වීම හේතුවෙන් 2013 වර්ෂයේදී විදුලිකණු නිෂ්පාදනය කටයුතු නවතා දමා තිබුණි. ඉන්පසු සමාලෝචිත වර්ෂය තෙක් කාලය තුල විදුලිකණුවල ගුණාත්වය ඉහල නංවමින් නැවත විදුලිකණු නිෂ්පාදනය ඇරඹීම හෝ වෙනත් සුදුසු ව්‍යාපාරයක් හඳුනා ගැනීම හෝ සිදු කර නොතිබුණි. තවද, 2024 දෙසැම්බර් 31 දිනට සමාගම රුපියල් මිලියන 18.98 ක සමුච්චිත අලාභයක් වාර්තාකර තිබුණි.	විදුලි කණු ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රාග්ධන කොටස රු.25,000,000 වන අතර සමුච්චිත පාඩුව ද වාර්තා කර ඇත. තවද,අවශ්‍ය ක්‍රියාමාර්ග ඉක්මනින් ගනු ලැබේ.	පාඩු ලබන සමාගම සම්බන්ධයෙන් කළමනාකාරීත්වය සුදුසු තීරණයක් ගත යුතුය.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය රුපියල් මිලියන 5.2 ක් වූ අතර මෙම වත්කම් සියල්ල 2013 වසරේ සිට නිෂ්ක්‍රියව පැවතුණි.	මෙම සියලු වත්කම්වල ලියාහල අගය ශුන්‍ය වන අතර ඒවා ගබඩා කිරීම සඳහා වස්කඩුව මධ්‍යම ගබඩා වෙත යවා ඇත.	ආයතනයේ සම්පත් වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි ප්‍රයෝජනයට යුතු වේ.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 උපායමාර්ගික සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	උපායමාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.